Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

සැප්තැම්බර් 02 සතිය

ශ්‍රේණිය - 10 (III වාරය)

සැකසුම - රූපිකා ජයන්ති (සිරිසමන් ජා. පා.)
දැරණියගල කොට්ඨාසය


පාඩම/ඒකකය - 3.2.1 සිඟිති ඇඳුමට මැවෙන රටා

## සිඟිති ඇඳුමට මැවෙන රටා

### 1. ඉගෙනුම් ආධාරක

- කුඩා දරුවෙකුගේ ඇඳුම් මැසිය හැකි සරල මෝස්තර සහිත රෙදි මෝස්තර කිහිපයක්
- කුඩා දරුවෙකුගේ ඇඳුමක ඡායාරූපයක්






### 2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- ළමුන්ගේ ඇඳුම් සඳහා යොදා ගත යුත්තේ සරල මෝස්තර ඒකකය
- ඒවා වැඩිහිටි ඇඳුම්වලට නොගැලපේ
- කුඩා දරුවෙකුගේ ඇඳුමකට යොදාගත යුත්තේ ආකර්ෂණීය වර්ණයන් ය
- කාටූන් හැඩතල වුව ද ඔබට යොදාගත හැකි ය
- එමෙන්ම මල්, කොළ හැඩ ද යොදාගත හැකි ය
- ඔබ දැක ඇති රෙදි මෝස්තර ආදර්ශයට ගත හැකි ය

3. ඇගයීම

1. ඔබ කැමති සරල  සත්ව රූපයක්, මලක් ආදී නිර්මාණයක් අඟල් 2 x 2 (2" x 2") කොටුවක ප්‍රමාණයට ඇඳගන්න.

2. එය මෝස්තර ඒකකය යි.

3. ටිෂූ කඩදාසියක් භාවිත කර මෝස්තර ඒකකය ඔබේ චිත්‍ර පොතේ ව්‍යාප්ත කර ඇඳගන්න.

4. මෙහි දී ව්‍යාප්ත මෝස්තරයක් ඇඳීමේ ආකාරයට ඇඳගත යුතු ය.

5. දැන් ඔබ කැමති දියසායම්, පැස්ටල් හෝ පොස්ටර් කලර් භාවිතයෙන් ඉතා අලංකාර ලෙස වර්ණ කරන්න.

6. පැය දෙකක කාලයක දී චිත්‍රය නිම කරන්න.